19
පාඩම
एकोनविंशः
पाठः

# සන්ධි

## සන්ධි

සන්ධි, සංස්කෘත භාෂාවේ ප්‍රධාන ව්‍යාකරණ සිද්ධාන්තයකි. සන්ධිවල දී මූලික වන්නේ ස්වර ව්‍යඤ්ජන ආදි අක්ෂරයෝ ය. ළං ව තිබෙන අකුරු දෙකක් එකතු කොට ගැළපීම සන්ධි නම් වේ. ගැමි ව්‍යවහාරයේ දී පොල් + අත්ත = පොල්ලත්ත ලෙස සන්ධි පදයක් වශයෙන් භාවිත වේ. අකුරු, වචන වෙන් කිරීම විසන්ධි ලෙස ද එකට එකතු වූ පසු සන්ධි ලෙස ද භාවිත කරනු ලැබේ. ලෝප, ආදේශ, ආගම, ද්විත්ව, ප්ලුත, හ්‍රස්ව, දීර්ඝ ආදි උපරීති රැසක් ද සන්ධිවලට දායක වේ. මුල් පදයේ අග අකුරත් අග පදයේ මුල් අකුරත් සන්ධි රීතියට යොමු වේ.

සංස්කෘත සන්ධිවල දී අභ්‍යන්තර සන්ධි හා බාහිර සන්ධි වශයෙන් දෙකොටසක් දැකිය හැකි ය.

1. එක ම පදයක සිදු වන එක් වීම අභ්‍යන්තර සන්ධි නම් වේ.

   උදා:- भर्तृ + आ = भर्ता

   භර්තෘ + ආ = භර්ත්‍රා = සැමියා

2. පද දෙකක් අතර සිදු වන එක් වීම බාහිර සන්ධි නම් වේ.

   උදා:- मुनि + इन्द्र = मुनीन्द्र

   මුනි + ඉන්ද්‍ර = මුනීන්ද්‍ර - බුදුරජාණන් වහන්සේ

සංස්කෘත සාරස්වත ව්‍යාකරණ ග්‍රන්ථයට අනුව සන්ධි වර්ග පහකි. ඒවා නම්

1. ස්වර සන්ධි
2. ව්‍යඤ්ජන සන්ධි
3. අනුස්වාර සන්ධි
4. විසර්ග සන්ධි
5. ප්‍රකෘති සන්ධි

ඉහත සන්ධි වර්ගවලට අයත් සන්ධි රීති බොහෝමයක් ඇත. ඒවා විස්තරාත්මක ව ඉහළ පන්තිවල දී උගත හැකි ය. මෙම ශ්‍රේණියේ දී ඒ ඒ සන්ධි වර්ග පිළිබඳ ව සාමාන්‍ය අවබෝධයක් සහ ඒ ඒ සන්ධි වර්ගයන්ට අයත් එක් සන්ධි රීතියක් පමණක් උගත හැකි ය.

## 1. ස්වර සන්ධිය

සන්ධි වන පදවල දී මුල් පදයේ අගත්, අග පදයේ මුලත් ස්වර අක්ෂර පැවතීම ස්වර සන්ධියේ ලක්ෂණය යි. ස්වරයන් මුල් වී ලෝප, ආදේශ, ආදි රීතිවලට යටත් ව සිදුවන සන්ධිය ස්වර සන්ධි නම් වේ.

උදා:- सुर + असुर = सुरासुर

**සන්ධි රීතිය**

මුල පදයේ අග සහ අග පදයේ මුල සමාන ස්වර ඇති විට ඒ දෙක ම එකතු ව එම වර්ගයේ ම එක් දීර්ඝයක් වේ.

**ස්වර පිහිටීම හා සන්ධිපද**

උදා:-

| | | | | | |
|---|---|---|---|---|---|
| උදා:- | अ | + | अ | = | आ |
| | अ | + | आ | = | आ |
| | आ | + | अ | = | आ |
| | आ | + | आ | = | आ |

අනෙක් इ उ ऋ ऌ ස්වර ද මේ ක්‍රමයෙන් පැවති විට ඒවායේ දීර්ඝය වේ.

परम + आनन्द > परम् + अ + आ + नन्द > परम् + आ + नन्द = परमानन्द

विद्या + अलङ्कार = विद्यालङ्कार

शाला + अधिपति = शालाधिपति

## 2. ව්‍යඤ්ජන සන්ධිය

සන්ධි වන පද දෙකෙහි ව්‍යඤ්ජන අක්ෂර මුල් වී සෑදෙන සන්ධිය ව්‍යඤ්ජන සන්ධි නම් වේ. ලෝප, ආදේශ, ද්විත්ව ආදි රීති එම සන්ධියට ද එලෙස ම බලපානු ඇත.

උදා:- वाक् + ईशः = वागीशः

**සන්ධි රීතිය**

ස්වරයක් පරකල්හි මුලින් යෙදී ඇති අඝෝෂයට එම වර්ගයේ ම ඝෝෂය ආදේශ වේ.

උදා:- अघोष + स्वर (अ, आ, इ, ई ආදි)
↓
घोष

එනම් क च ट त प යන අඝෝෂයන්ට පිළිවෙළින් ग ज ड द ब ඝෝෂයෝ වෙති.

वाक् + अर्थः > वाग् + अर्थः = वागर्थः
अच् + अन्तः > अज् + अन्तः = अजन्तः
षट् + अङ्गः > षड् + अङ्गः = षडङ्गः
महत् + इदम् > महद् + इदम् = महदिदम्
ककुप् + अत्र > ककुब् + अत्र = ककुबत्र

## 3. අනුස්වාර සන්ධිය

අනුස්වාරය හෙවත් 'ං' (බින්දුව) මුල් වී සෑදෙන සන්ධිය අනුස්වාර සන්ධි නම් වේ. ව්‍යඤ්ජන සන්ධියේ ම කොටසක් වන මෙය ද, ලෝප - ආදේශ ආදි රීතිවලට අනුගත වේ.

උදා:- किं + अस्ति = किमस्ति

**සන්ධි රීතිය**

ස්වරයක් පරකල්හි මුලින් යෙදී ඇති අනුස්වාරයට (බින්දුවට) 'ම්' ආදේශ වේ.

උදා:- ං + स्वर
↓
म्

इदं + आसनम् > इदम् + आसनम् = इदमासनम्
गृहं + आगच्छति > गृहम् + आगच्छति = गृहमागच्छति
जलं + आदाय > जलम् + आदाय = जलमादाय

## 4. විසර්ග සන්ධිය

විසර්ගය (ඃ) සංස්කෘත නාමපදවලට විශේෂ වූවකි. එම විසර්ගය මූලික වී ලෝප, ආදේශාදි ක්‍රමවලින් සෑදෙන සන්ධිය විසර්ග සන්ධි නම් වේ. මුල් පදයේ විසර්ගය යෙදී තිබීම මෙහි මූලික ලක්ෂණයකි.

උදා:- कविः + एति = कविरेति

**සන්ධි රීතිය**

ස්වරයක් හෝ ඝෝෂාක්ෂරරයක් පර ව සිටි කල්හි නාමින් ස්වර කෙරෙන් පර විසර්ගයට (ඃ) 'ර්' යන්නක් ආදේශ වේ.

උදා:- नामिन् + ः + स्वर / घोष
↓
र्

मुनिः + आगच्छति > मुनिर् + आगच्छति = मुनिरागच्छति

भानुः + उदेति > भानुर् + उदेति = भानुरुदेति

कविः + गच्छति > कविर् + गच्छति = कविर्गच्छति

वायुः + वाति > वायुर् + वाति = वायुर्वाति

## 5. ප්‍රකෘති සන්ධිය

ස්වර, ව්‍යඤ්ජන ආදි ඉහත කී සන්ධිවල දී මෙන් ලෝප - ආදේශ ආදි ක්‍රමවලින් සන්ධි නොවන සන්ධි විශේෂ ප්‍රකෘති සන්ධි නම් වේ. සන්ධි, විසන්ධි පද දෙකේ දී ම එක ම අයුරින් වචනය පිහිටීම හෙවත් ස්වභාවයෙන් ම සන්ධි වී පැවතීම ප්‍රකෘති සන්ධියේ විශේෂ ලක්ෂණය වේ.

උදා:- अग्नि + अत्र = अग्नि अत्र

हे + बुद्ध = हे बुद्ध

अहो + ईश्वर = अहो ईश्वर

## 19.1 අභ්‍යාසය

01. පහත සඳහන් පද සන්ධි කරන්න.

| | | |
|---|---|---|
| १ कवि + ईश्वर | २ धनुः + आनयति | ३ गज + आननः |
| ४ बुद्धं + अवन्दत् | ५ पाठालयात् + आगच्छति | ६ अहो + देव |
| ७ अयं + एव | ८ हे + छात्र | ९ गौ + धावति |
| १० उत् + गच्छति | | |

02. පහත සඳහන් වාක්‍ය සිංහලයට නඟන්න. ඉරි ඇඳි පද විසන්ධි කොට දක්වන්න.

१ जनाः दानेन परमानन्दं लभन्ति ।

२ जनाधिपः परेद्युः विदेशमगच्छत् ।

३ प्रभाते एव मुनिरागच्छति आश्रमम् ।

४ वर्षाकाले सर्वत्र वायुर्वाति ।

५ हे छात्र त्वं नित्यं सत्यं वद ।

६ गुरवः पाठालयात् आगच्छन्ति अहं ।

७ उत्पीटिकायां छात्रस्य पुस्तकमस्ति ।

८ भारतदेशे जनाः गजाननं पूजयन्ति ।

९ कृषीवलाः सर्वदा एव उटजमागच्छन्ति ।

१० पराक्रमसमुद्रः किल सिन्धूपमानः इति जनाः वदन्ति ।

භාවිතයට

**सुखार्थी चेत् त्यजेद्विद्यां - विद्यार्थी चेत् त्यजेत् सुखम् ।**
**सुखार्थिनः कुतो विद्या - कुतो विद्यार्थीनः सुखम् ॥**

සැප කැමැත්තේ නම් ඉගෙනුම අත්හරින්නේ ය. ඉගෙනුම කැමැත්තෙහි නම් සැප අත්හරින්නේ ය. සැප කැමැත්තහුට ඉගෙනුමක් කොයින් ද?, ඉගෙනුම කැමැත්තහුට සැපක් කොයින් ද?.